## ස්ථාවරත්වයේ නාමයෙන් පනවන තවත් දුක් වේදනා

**ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව විසිනි.**

පසුගිය මාස කිහිපය තුළ ආර්ථික දුෂ්කරතා උග්‍ර වී ඇති අතර, ශ්‍රී ලංකාවේ පන්ති භේදය වෙන කවරදාටත් වඩා දෘශ්‍යමාන වේ. රාජ්‍ය මර්දනය හරහා 'ස්ථාවරත්වය' ඇති කර ගැනීමට රජය යොමු වී ඇත. රනිල් වික්‍රමසිංහ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන් දා සිට "අරගලය" එනම්, ජනතා අරගලයට සම්බන්ධ වූ ශිෂ්‍ය සංගම් නායකයින්, ක්‍රියාකාරීන්, කලාකරුවන් සහ පුරවැසි විරෝධතාකරුවන් කිහිප දෙනෙකුට එරෙහිව මර්දනය දැඩි වී තිබේ. ක්‍රියාකාරීන් 3,300 කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති අතර 1,250 ක් පමණ තවමත් අත්අඩංගුවේ පසුවෙති. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) භාවිතා කිරීම විලම්භනය කිරීමේ තමන්ගේම පොරොන්දුව නොසළකා හරිමින්, ආණ්ඩුව ශිෂ්‍ය නායකයින් රඳවා තබා ගැනීමට එය භාවිතා කර ඇත. වැඩකරන පන්තියේ කාන්තාවන් සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැඩි අස්ථාවරත්වයක් ඇති කරන මර්දනය සහ ආර්ථික ප්‍රතිපත්තිය සුපුරුදු වැඩ අනුපිළිවෙල බව පෙනේ.

**අතුරු අයවැය**

දැඩි අරපිරිමැස්ම සඳහා කරන කප්පාදු පියවරයන් හඳුන්වාදෙමින් සහ රජය සතු ව්‍යවසායන් (SOEs) පෞද්ගලීකරණය කරමින් අතුරු අයවැයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී . එකතු කළ අගය මත බද්ද (වැට්) 12% සිට 15% දක්වා සංශෝධනය කිරීම නිසා ඍජු බදු තවදුරටත් වැඩි විය. ඒ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල උද්ධමනය සිතාගත නොහැකි මට්ටමට ළඟා වෙමින් තිබියදී ය. සමාජ ආරක්ෂණය සඳහා වූ අතුරු අයවැය යෝජනා මගින් ගැබිණි මව්වරුන් සඳහා පවතින රාජ්‍ය දායකත්ව මුදල (රු. 2,500 කින්), සමෘද්ධි සඳහා මාසික දීමනා ( රු. 3,000 සිට රු. 3,100 දක්වා), වැඩිහිටි දීමනාව (රු. 2,000 සිට රු. 5,000 දක්වා) සහ අඩු- ආදායම් ආබාධිත පුද්ගලයින් සහ අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා වන දීමනා (රු. 5,000 සිට 7,500 දක්වා). වැඩි කරන ලදී. මීට අමතරව අඩු ආදායම්ලාභී පවුල් 61,000කට රුපියල් 5,000ක් බැගින් ලබාදීමට නියමිතය. පවතින උද්ධමන මට්ටම් සලකා බැලීමේදී අවශ්‍යතා සපුරාලීමට මෙම ක්‍රියාමාර්ග පවා අතිශයින් ප්‍රමාණවත් නොවේ. ආහාර උද්ධමනය අගෝස්තු මාසයේදී 93.7% දක්වාත් ප්‍රවාහන උද්ධමනය 148.6% දක්වාත් ඉහළ ගොස් ඇත. අර්බුදය දැනෙන්නට පෙර පවා, ශ්‍රී ලංකාව සමාජ ආරක්ෂණය සඳහා වැය කළේ දළ දේශීය නිෂ්පාදිතයෙන් (2015) 3.2%ක් පමණක් වන අතර එය ආසියාවේ අඩුම ප්‍රතිපාදනය වන අතර මධ්‍යම ආදායම් ලබන රටවල් විසින් වියදම් කරන ලද 3.9% සාමාන්‍යයට වඩා අඩුය. ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) අනුව හතර දෙනෙකුගෙන් යුත් පවුලකට මාසිකව අවම වශයෙන් රු. 100,000 ජීවත් වීමට අවශ්‍ය ය. තවද, නිවාස 10කින් තුනකට (මිනිසුන් මිලියන 6.26) ආහාර අනාරක්ෂිතාව ඇති අතර ඉන් 65,600ක් දැඩි ලෙස ආහාර අනාරක්ෂිතතාවයට ලක්වී ඇත. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (යුනිසෙෆ්) ඇස්තමේන්තුවලින් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ළමුන් මිලියන 2.3 කට මානුෂීය ආධාර කඩිනමින් අවශ්‍ය බවයි. ජාතික ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ජනාධිපති කමිටුවේ සභාපතිවරයා අනාවරණය කළේ පවුල් ලක්ෂයක් මන්දපෝෂණයෙන් පෙළෙන බවත් ඉන් 75,000ක් මේ වන විට නිරාහාරව බව නිසා ඇතිවන මරණ වළක්වා ගැනීමට අරගල කරන බවත්ය. පවුල් 40,000ක් පමණ ලවණ ජලය හරහා ආහාර හෝ පෝෂණය ලබා ගනිති. අතුරු අයවැය මගින් තත්වයේ බරපතලකම හෝ අවශ්‍ය සහයෝගයේ හදිසිභාවය පිලිබිඹු නොවේ. විනාශයට පත් වූ පොහොර තහනම සහ ඉන්ධන අර්බුදයෙන් පසු අභියෝගවලට මුහුණ දී සිටින කෘෂිකාර්මික ක්ෂේත්‍රය යළි නගා සිටුවීමට ද එය අපොහොසත් විය . අධ්‍යාපන ක්ෂේත්‍රයට පවා, පාසල් අධ්‍යාපනයට දිගුකාලීන බාධා කිරීම් සහ දරුවන් අතර පවතින දරුණු මන්දපෝෂණයෙන් පසුව, ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබී නැත. ජනගහනයේ විශාල කොටස් මෑතක සිට ඇද වැටී ඇති දරිද්‍රතාවයට අයවැය ප්‍රතිචාර දක්වා නැත. රටේ ආර්ථික ප්‍රතිපත්තිවලට සහාය වීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ මාස 48 ක විධිවිධානයක් සමඟ ඩොලර් බිලියන 2.9 ක් සඳහා කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට (SLA) එළඹ ඇත. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති නිර්දේශවලට ඇතුළත් වන්නේ ජනතාවට සුළු සහනයක් සහිත දැඩි අරපිරිමැස්ම සඳහා කරන කප්පාදු පියවරයන් ය. එය සමාජ වියදම් ඉහළ නැංවීමට යොමු වුව ද ,ඇත්තේ

අර්බුදය විසඳීමට ප්‍රමාණවත් නොවන මුදල් හුවමාරු සහ ඉලක්කගත සහය සහිත  රාමුවක් තුළ ය. විශේෂයෙන්ම ආර්ථික අර්බුදයකදී විශ්වීය සමාජ ආරක්ෂාව සඳහා කාන්තා කණ්ඩායම් විසින් නැවත නැවතත් කරන ලද ඉල්ලීම් තවමත් නොසලකා හරිමින් ඇත. අතුරු අයවැයේ දැඩි ජනතා-විරෝධී වැඩපිළිවෙළ සහ ජා.මූ.අ. IMF නිර්දේශවල ඇති අසංවේදිතාව පිළිබඳ අතිශයින් සැලකිලිමත් වන්නේ එය, ශ්‍රී ලංකාවේ කාන්තාවන්, වැඩකරන ජනතාව සහ දුප්පතුන් වෙත කිසිදු සැකයකින් තොරව බර පටවන බැවිනි.

**බලශක්ති දරිද්‍රතාවය**

ඉන්ධන සහ විදුලිය සඳහා 'පිරිවැය ප්‍රතිසාධන මිල' යාන්ත්‍රණයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශවලට ඇතුළත් වේ. අගෝස්තු මාසයේදී ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වසර නවයකට පසු පළමු වරට විදුලි ගාස්තු ඉහළ නැංවීය. අවම වශයෙන් පරිභෝජනය කරන පිරිසට  , මසකට ඒකක 30 ට අඩු  සඳහා 264% කින් (ඒකක 30-60 කින් 211% කින්) විශාලතම වැඩිවීමක් ලැබෙනු ඇත. මෙයින් අදහස් කරන්නේ ගෘහස්ත විදුලි පාරිභෝගිකයින්ගෙන් අඩක් එනම්,  මසකට ඒකක 60 ට අඩු ප්‍රමාණයක් භාවිතා කරන මිලියන 3.14 ක පවුල් - විදුලි බිල්පතෙහි විශාලතම වැඩිවීමට මුහුණ දෙන බවයි. විදුලි ගාස්තු වැඩිකිරීම් බලශක්ති යුක්තියේ මූලධර්මවලට පටහැනි වන අතර, මෙම වැඩිවීම්වල විශාලතම බර දරන්නේ කාන්තාවන්ය. කුටුම්භවල පිරිවැය අඩු කිරීමේ පියවර සාමාන්‍යයෙන් කාන්තාවන් මත වැටේ. කුස්සියේ බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රයත්නයන් පෝෂණයට බලපාන අතර, කුටුම්භය තුළ ආහාර පිසීම අඩු වේ. බලශක්ති දරිද්‍රතාවයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බලපෑම කාන්තා හා ගැහැණු ළමුන්  පරම්පරාවකට සීමා පනවනු ඇත, ඔවුන්ට කාලය අහිමි කරනු ඇත., සහ අධ්‍යාපනයට සහ ශ්‍රම බලකායට ඔවුන්ගේ ප්‍රවේශය අවහිර කරනු ඇත. කොවිඩ්-19 වසා දැමීම් අතරතුර දැනටමත් නොගෙවූ විදුලි බිල්පත් රැස්කරගෙන සිටින නිවාස  අතර බලශක්ති අවිනිශ්චිතතාවය වැඩි වන අතර ඔවුන් ණය චක්‍රයේ ගැඹුරට තල්ලු කරනු ඇත. ශ්‍රී ලංකාව 100%ක් පමණ විදුලිබල පහසුකම ලබාගෙන ඇතත්, ගාස්තු වෙනස් කිරීම මත  නිවාස අඳුරේ ගිලෙනු ඇත. භූමිතෙල් මිල රු. 87 සිට රු. 340 ඉහළ යාම  ග්‍රාමීය ආර්ථිකයට විශේෂයෙන් දුර්වල බලපෑමක් ඇති කළේය. භූමිතෙල් හිඟය සහ මිල ඉහළ යාම හේතුවෙන් ධීවරයින්ට බෝට්ටු භාවිත කිරීමට සහ තම ජීවනෝපාය කටයුතුවල නිරත වීමට නොහැකි වී තිබේ. කුඩා පරිමාණ ගොවීන් වගා කටයුතු සඳහා ජල පොම්ප ක්‍රියාත්මක කිරීම සඳහා භූමිතෙල් මත යැපේ. භූමිතෙල් මිල ඉහළ යාමෙන් ගොවීන්ට නිෂ්පාදනයේ නියැලීම වැළැක්විය හැකි අතර එමගින් ආහාර සුරක්ෂිතතාවට බලපෑම් ඇති වේ.

**අධ්‍යාපනික ප්‍රතිඵලවල  හෙළිදරව්ව**

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, ශ්‍රී ලංකාවේ සියලුම දරුවන්ගෙන් අඩක් (42%) ආර්ථික අර්බුදයට පෙර දරිද්‍රතාවයේ ජීවත් වූ අතර, අවුරුදු හතරට අඩු දරුවන්ගෙන් තුනෙන් එකක් අඩු බර හෝ උසින් අඩු ය. අධ්‍යාපන ක්ෂේත්‍රය අසීරු අදියරකට පැමිණ ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගෙන තිබේ. ආර්ථික අර්බුදයට මුහුණ දීම කොවිඩ්-19 තත්වයට වඩා අභියෝගාත්මක වන්නේ  ඉගෙනීමේ පාඩුව දැනටමත් 54% (2020) සහ 88% (2021) දක්වා ළඟා වී ඇති හෙයිනි. ආර්ථික අර්බුදය සිසුන් බඳවා ගැනීම් අඩුවීමට බලපා ඇත. සේව් ද චිල්ඩ්‍රන් (Save the Children) ආයතනයට  අනුව, පාසල් ආහාර වැඩසටහනට රජයේ අරමුදල් කපා හැරීම මත, සිසුන් හතර දෙනෙකුගෙන් එක් අයෙක් කුසගින්නේ සිටීමට ඉඩ ඇත.  අනපේක්ෂිත පාසල් වසා දැමීම් දරුවන් කුසගින්නේ තබන්නේ නොමිලේ ලැබෙන පාසල් ආහාර රටේ වඩාත්ම අවදානමට ලක්විය හැකි දරුවන් මිලියනයකට ජීවන මාර්ගයක් වන බැවිනි. පවුල් පහෙන් දෙකක දරුවන්ට අන්තර්ජාල ගාස්තු හෝ ස්මාර්ට් ජංගම දුරකථන ලබා ගැනීමට නොහැකි නිසා මාර්ගගත ඉගෙනීම දිගටම කරගෙන යාමට නොහැකි වී ඇත. නිදහස් පොදු පද්ධතියක් හරහා ලබා ගත් ඉහළ සාක්ෂරතා මට්ටම් සහ බාලිකා අධ්‍යාපනයේ අධ්‍යාපනික ජයග්‍රහණ, අර්බුදය මධ්‍යයේ දිග හැරෙමින් තිබේ.

**කාන්තාවන්ගේ ගෙවන /නොගෙවන ශ්‍රමය සූරාකෑම**

අර්බුදය මධ්‍යයේ නව නීති කඩිනමින් සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය රජයට පෙනෙන්නට තිබේ. ව්‍යාපාර ක්‍රියාවලියන්  බාහිරින් ලබා දෙන ආයතනවල කාන්තාවන්ට රාත්‍රියේ වැඩ කිරීමට නීත්‍යානුකූලව අවසර ලබා දෙන 1954 සාප්පු සහ කාර්යාල සේවක පනත වෙනස් කිරීමට කැබිනට් අනුමැතිය හිමි විය . සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අවම වයස අවුරුදු 25 සිට 21 දක්වා අඩු කර ඇති අතර කුඩා දරුවන් සිටින (අවුරුදු දෙකට අඩු) කාන්තාවන් සංක්‍රමණය වීම වැළැක්වීම සහ සංක්‍රමණය වීමට පෙර, අනිවාර්ය පවුල් පසුබිම් වාර්තාවක් ලබා ගත යුතු බවට පනවා තිබූ සීමාවන් ඉවත් කර ඇත. කම්කරු අමාත්‍යාංශය ළමයින්ට (16 සහ ඊට වැඩි) වැඩ කිරීමට ඉඩ දීම සඳහා පවතින නීති සංශෝධනය කිරීමට කටයුතු කරමින් සිටී. 2022 ජූනි දක්වා මාස හය තුළ, ග්‍රාමීය දූප්පතුන් 777 ක් - 2021 ට වඩා හතර ගුණයක් - සංක්‍රමණික කම්කරුවන් ලෙස දිනපතා ශ්‍රී ලංකාව හැර ගොස් ඇත. කම්කරු නීති වඩාත් නම්‍යශීලී කර ඇති අතර , සේවා කොන්දේසි සූරාකන ලෙස  සහ අස්ථිර ලෙස පවතී. 2020 දී ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් 114 දෙනෙකු ඔවුන්ගේ සේවා ස්ථානවල මිය ගිය අතර මෙම අනතුරුවලට ප්‍රතිචාර දැක්වීමට කිසිදු පියවරක් ගෙන නොමැත. ඒ වෙනුවට බොහෝ ග්‍රාමීය දූප්පතුන් සංක්‍රමණය වීම සඳහා තල්ලු කරමින් පවතී. ආරක්ෂිත සේවා කොන්දේසි, සමාන වැටුප් සහ රැකවරණ යාන්ත්‍රණයන් සඳහා නිසි ප්‍රතිපාදන නොමැතිව, කම්කරු නීති ප්‍රතිසංස්කරණ යටතේ කාන්තාවන් සහ ළමුන් ප්‍රථමයෙන් ඉලක්ක කර ගැනීම අදාළ කරගෙන ඇත.  . රාජ්‍ය අංශයේ රැකියා වැනි කාන්තාවන් සඳහා වඩා හොඳ සේවා කොන්දේසි සහිත රැකියා දැඩි අරපිරිමැස්ම සඳහා ගන්නා කප්පාදු පියවරයන් යටතේ කපා හරිනු ලැබේ. රාජ්‍ය සේවකයින්ට වසර පහක උපරිම කාලයක් සඳහා විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට සහ අනිවාර්ය මාසික විදේශ ප්‍රේෂණ මෙරටට  යැවීමට පහසුකම් සැලසීමේ චක්‍රලේඛයක් නිකුත් කර ඇත. දේශීය වශයෙන් රැකියා උත්පාදනය කිරීමේ සැලැස්මක් රජයට නැත. ඒ වෙනුවට, එය කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම කෙරෙහි එතරම් තැකීමක් නොකර, විදේශ විනිමය උපයා ගැනීමේ පහසු මාධ්‍යයක් ලෙස ශ්‍රම සංක්‍රමණය දිරිමත් කරයි . තවද, අතුරු අයවැය මගින් රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 සිට 60 දක්වා අඩු කිරීමට යෝජනා කර ඇති අතර, එමගින් පුද්ගලයින් විශ්‍රාම ගැන්වීමට තල්ලු කර ඔවුන්ගේම මූල්‍ය සුරක්ෂිතභාවය සොයා ගැනීමට ඔවුන්ට බල කෙරේ. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය වැඩි කිරීම සඳහා රෙගුලාසි ලිහිල් කිරීම ජා.මූ.අ. (IMF) විසින්  නිර්දේශ කර ඇත.  කාන්තාවන්ගේ ශ්‍රමයේ මෙම වෙනස්කම් බොහෝ විට කාන්තාවන්ට වැඩි 'තේරීමක්' ලබා දීම පිළිබඳ නිදහස් මතධාරී  තර්ක සමඟ එක්ව තිබේ. නිවසින් පිටත වැඩ කිරීම සාමාන්‍යයෙන් බිහිසුණු සේවා තත්ත්වයන් සහ පරතෙරක් නොමැති වැටුප් යන කාරනය සමඟ සටන් කිරීමට එය අසමත් වන අතර, සමහර විට හිතාමතාම ප්‍රතික්ෂේප කරයි. මෙම වැඩකිරීම සඳහා වන 'තේරීම' කාන්තාවන් සූරාකෑමට සහ වෙනස් කොට සැලකීමට නිරාවරණය කිරීමට හිතාමතා සකස් කර ඇති  ප්‍රතිපත්ති සමඟ රජය විසින් කරන ආර්ථික තත්වයට ප්‍රතිචාර දැක්වීමට වඩා වැඩි යමක් නොවේ. වැටුප් නොලබන රැකවරණ වැඩ සහ සමාජ ප්‍රතිනිෂ්පාදනය ද ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වය පිළිබඳ සංවාදයෙන් ඉවත් වේ. කාන්තාවන්ට ඔවුන් දැනටමත් නියැලී සිටින ගෘහ සේවයට වඩා අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් ආදායම සොයා ගැනීම සඳහා වැටුප් සහිත ශ්‍රමයේ නිරත වීමට බල කෙරෙයි. රැකවරණ සේවා දායකත්වය හඳුනා නොගන්නා කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය විසින්  කාන්තාවන් මත ද්විත්ව බරක් පටවයි.  ඉන්ධන සහ බලශක්තිය වැනි ආහාර නොවන අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ඉහළ යාමේ සන්දර්භය තුළ මුදල් ආදායමේ අවශ්‍යතාවය, කාන්තාවන් මත ඇති බර උග්‍ර කරයි. පිරිමින්ට දෛනික කුලී වැඩ සඳහා ඇති අවස්ථා හීන වී යන විට වැටුප් ගෙවන හා නොගෙවූ ශ්‍රමයේ නියැලීමේ බර කාන්තාවන් වෙත ද පැවරී ඇත . කොවිඩ්-19 අර්බුදයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බලපෑම පිළිබඳව අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක (කාරෙයිතිව් සහ සමන්තුරේ) සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයකින්  පෙන්වා දී ඇත්තේ කාන්තාවන්ගෙන් 46%, වසංගතය හේතුවෙන් නිවෙස් තුළ තම රැකවරණ කටයුතු ඉහළ ගොස් ඇති බව ප්‍රකාශ කර ඇති බව ත්  37.5% ක්  ආදායම් නොමැතිකම නිසා ආහාර පරිභෝජනය අඩු කර තිබූ බවත් ය. වසර තුනක් මුළුල්ලේ කාන්තාවන් නිවසේ පැවැත්ම කළමනාකරණය කිරීමේ බර උසුලා සිටින අතර, මේ වන විට කෙරෙන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නාමයෙන් දැඩි සේවා කොන්දේසිවලට තල්ලු කිරීම අතිශය භයානක ය.

මර්දනය සහ දැඩි අරපිරිමැස්ම සඳහා කරන කප්පාදුවේ අවසානය

කැලඹිලි සහිත වසරක අවසාන කාර්තුවට අප එළඹෙන විට , ආර්ථික අර්බුදයේ ගැඹුර සහ එහි විනාශකාරී බලපෑම් පැහැදිලිව පෙනේ. ශ්‍රී ලංකා රජය විසින් යොදවා ඇති කප්පාදු සහ මර්දනය යන ද්විත්ව උපායමාර්ගය මිනිසුන්ට තවත් දුක් විඳීමට හේතු වී ඇති අතර ප්‍රකෘතිමත් වීම සඳහා වූ අපගේ බලාපොරොත්තු සුන් කර ඇත. විරුද්ධ අදහස් දැක්වීමට ඇති අයිතිය උදෙසා කටයුතු කරන ක්‍රියාකාරීන් බිය ගැන්වීම්, හිරිහැර කිරීම්, පදනම් විරහිත පරීක්ෂණ සහ අත්අඩංගුවට ගැනීම් රජය වහාම නැවැත්විය යුතුය. තරුණයින් අසාධාරණ ලෙස රඳවාගෙන සිටින කුරිරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු අතර ඒ වෙනුවට වෙනත් නීතියක් ආදේශ නොකළ යුතුය. දීපව්‍යාප්ත ආහාර බෙදා හැරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම මගින් පෝෂණය සහ ආහාර ස්වෛරීභාවයට ප්‍රමුඛත්වය දිය යුතු අතර දැනට පවතින සතොස , සමෘද්ධි සහ සමුපකාර පද්ධති පුළුල් කළ යුතුය. අවිනිශ්චිත තත්ත්වයන් සහ දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින්ගේ සංඛ්‍යාව වැඩිවෙමින් පවතින බැවින් ආහාර සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපාදන සඳහා විශ්වීය වැඩසටහන් වෙත ගමන් කිරීම ඉතා වැදගත් වේ. පුළුල්ව පැතිරී ඇති අහිමිවීම් මධ්‍යයේ ඉලක්කගත වැඩසටහන් සඳහා වන ඕනෑම උත්සාහයක් අතෘප්තියට සහ සමාජ නොසන්සුන්තාවයට තුඩු දෙනු ඇත. සියලු නිවාස සඳහා වන ඉන්ධන, විදුලිය, ජලය, භූමිතෙල්, LP ගෑස් සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා වන සහනාධාර ගලවා ඉවත් නොකළ යුතුය. ගැඹුරු වන ආහාර අර්බුදය වැලැක්වීම සඳහා කඩිනම් ආධාර සහ සහනාධාර ගොවීන් සහ ධීවරයින් වෙත ළඟා විය යුතුය. තවද, පාසල්වල දිවා ආහාර වැඩසටහන, හොඳ සම්පත් සපයා ගැනීම සහ වහාම ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක කිරීම සහතික කිරීම ද අත්‍යවශ්‍ය වේ. සාගින්න, නිවාස නොමැතිකම, අගහිඟකම් සහ ගෘහස්ථ හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ආධාර වැඩසටහන් (යොමු කිරීම, සහාය සහ සේවා) රජය විසින් වහා පිහිටුවිය යුතු අතර වෙනස් කොට සැලකීමකින්, අගතියකින් හෝ විනිශ්වයකින් තොරව මෙම සේවාවන් සැපයීමට රාජ්‍ය නිලධාරීන් යොමු කළ යුතුය. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ වැඩිවීම පැහැදිලිව පෙනෙන බැවින්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සේවාවන් කාන්තාවන් සහ ළමුන් සඳහා නවාතැන් ඇතුළු ආධාර සේවා සහතික කළ යුතුය. ප්‍රතිචාර කාලෝචිත විය යුතු අතර දිවි ගලවා ගත් අය කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක් තිබිය යුතුය. අවසාන වශයෙන්, සූරාකෑමේ කම්කරු නීති ප්‍රතිසංස්කරණ වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කළ යුතුය. රාජ්‍යයට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට රටේ ණය ගෙවීමේ බර කාන්තාවන් සහ දරුවන් මත පැටවීමටත් ඔවුන් අනාරක්ෂිත හා සූරාකෑමේ සේවා කොන්දේසිවලට තල්ලු කිරීමටත් නොහැකිය. ජීවන වියදමේ තියුණු ඉහල යාමට ගැලපෙන ජීවන වැටුපක් සියලු අංශ වලට හඳුන්වා දිය යුතුය. අසාධාරණ සහ ශ්‍රම සූරාකෑමේ ක්‍රියාවන් පිළිබඳ කම්කරුවන්ගේ පැමිණිලි විසඳීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය. වැටුප් නොලබන රැකවරණ කාර්යයේ වැඩි වී ඇති බර හඳුනා ගැනීම සහ දිවා සුරැකුම්, වැඩිහිටි සත්කාර, ආහාර බෙදා හැරීම සහ කාන්තාවන් මුහුණ දෙන දැඩි පීඩනයෙන් මිදීම සඳහා මනෝ සමාජීය ආධාර සඳහා යාන්ත්‍රණ සම්පාදනය කරමින් ගෙවන හා නොගෙවන ශ්‍රමය හරහා රටට ලැබෙන ඔවුන්ගේ අඛණ්ඩ දායකත්වය සහතික කළ යුතුය.

(ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව යනු ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය විශ්ලේෂණය කර නිර්දේශ යෝජනා කිරීමට එක්වූ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සේවය කරන ස්ත්‍රීවාදී ආර්ථික විද්‍යාඥයින්, විද්වතුන්, ස්ත්‍රීවාදී ක්‍රියාකාරීන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ නීතිඥයින්ගේ එකතුවකි. )